www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මරුදමුනෙයි: සුනාමි ව්‍යසනයට ගොදුරු වූ ශ්‍රී ලංකාවේ ගමක්

## Maruthamunai: a tsunami-devastated village in Sri Lanka

**ශාන්ත කුමාර සහ ඩබ්ලිව්. ඒ. සුනිල් විසිනි**
**2005 දෙසැම්බර් 29**

පසුගිය සතියේ *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* වාර්තාකරුවෝ කන්ඩායමක් පසුගිය දෙසැම්බර් මාසයේ දී සුනාමි ව්‍යසනයට ගොදුරු වූ ශ්‍රී ලංකාවේ එක් ගමක් වන මරුදමුනෙයි ගමට ගියහ. යුද්ධයෙන් විනාශ වූ නැගෙනහිර පලාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කොළඹ සිට කි.මී.260පමන දුරින් එය පිහිටා තිබේ.

සුනාමියට පෙර ගමේ නිවාස මුහුදු සීමාවේ සිට මීටර් 7.5ක් ඇතුලත ගොඩ නගා තිබූ නමුත් ද්වැන්ත සුනාමි රළ පහර මුහුදු සීමාවේ සිට කිලෝ මීටරයක් පමන දුරට වේගයෙන් ගසා ගෙන ගියේ ය. දැන් මුහුදු වෙරලේ සිට මීටර් 250 පමන දුරට ශේෂව ඇත්තේ පෙර පැවති නිවාසවල අත්තිවාරම් පමනි. ගම්මුන් සිටියේ කනස්සල්ලෙනි. වසරකට පසුවත් එකම ස්ථිර නිවසක්වත් තනා නැත. අවතැන්වූවෝ තාවකාලික නිවාස, පාර්ශ්වීය වසයෙන් විනාශ වූ නිවාසවල හෝ ඔවුන්ගේ ඥාතීන් සමග ජීවත් වෙත්.

රාජ්‍ය නොවන සංවිධානයක් වන නැගෙනහිර සමාජ බලමුලුගැන්වීමේ සංවිධානය ට අනුව සාපේක්ෂව විශාලවූ මෙම ගමේ සුනාමියට පෙර පවුල් 4,739ක් හෙවත් 17.393 ජන සංඛ්‍යාවක් සිටියහ. ධීවරයෝ, අත් යන්ත්‍ර පේෂකාර්මිකයෝ, සුලු ව්‍යාපාරිකයෝ කුකුලු සහ වෙනත් සත්ව ගොවීන් සහ රාජ්‍ය සේවකයෝ ඔවුන් අතර වූහ.

නිල වසයෙන් මරනයට පත් වූ සංඛ්‍යාව 922ක් සහ ඇවතැන් වූවන් 11,086කි. නිවාස 1,391 මුලුමනින්ම විනාශ වූ අතර 1,359 පාර්ශ්වීය වසයෙන් විනාශයට පත් විය. එහෙත් යන්තමින් ස්ථිර නිවාස සියයක් ගොඩ නැගීම තවමත් ඇත්තේ ආරම්භක අවධියේ ය.

නියමාකාරයෙන් සහනාධාර ලබා දීම සහ ස්ථිර නිවාස ඉල්ලා අප්‍රේල් සහ මැයි මාසවල දී පසුගිය මාස 12 තුල ගම්මු දෙවරක් උද්ඝෝෂනය කලහ. එහෙත් පලක් නොවුනි.

ඊට ප්‍රතිවිරුද්ධ ලෙස, දෙමල, මුස්ලිම් සහ සිංහල ජනයා විනාශ වූ වහාම ස්වකැමැත්තෙන් ඔවුන්ට උපකාර කිරීමට ඉදිරිපත් වූ ආකාරය ඔවුහු මතක් කලහ. "අප තවමත් අඳින්නේ මෙම කාරුනික මිනිසුන් දුන් ඇඳුම්" යයි කිහිප දෙනෙකුම අපට පැවසූහ.

වැන්දඹුවක වූ 33 වියැති අයතුල්ලා බීබී ඇගේ අතිශය ඛේදජනක අත්දැකීම් මෙසේ පැවසී ය. "මට මගේ සැමියා සහ දරුවන් දෙදෙනෙකු අහිමි වුනා. අපේ නිවස මුලුමනින්ම විනාශ වුනා. මා දැන් දරුවන් දෙදෙනෙකු සහිත වැන්දඹුවක්. අපේ නිවස පිහිටා තිබුනේ ආන්ඩුව විසින් නිවාස තැනීමට දැන් තහනම් කර ඇති සීමාවේ. ආන්ඩුවේ මෙම තහනම නිසා අපේ නිවාස ප්‍රශ්නය කවදා විසඳේවිදැයි මට සිතාගන්න බැහැ."

(ආන්ඩුව මුලදී උතුරේදී මීටර් 200ක සහ දකුනේ දී මීටර් 100ක් ඇතුලත යලි ගොඩ නැගීම් තහනම් කලේ ය. කෙසේ නමුත්, විරෝධතාවලින් පසුව දකුනු පලාත්වල එම සීමාව අහෝසි කල අතර නැගෙනහිර සහ උතුරේ සීමාව මීටර් 65 දක්වා අඩු කලේ ය.)

"දැනට අප ජීවත්වෙන්නේ රාජ්‍ය නොවන සංවිධානයකින් ලබා දුන්න පුංචි කුඩාරමක. ඔබට පෙනෙනවා අපට කිසිම පහසුකමක් නැති බව. අප පාවිච්චි කරන්නේ පොදු වැසිකිලි. බීමට වතුර බවුසරවලින් ගෙනැවිත් දෙනවා. නමුත් රෙදි සේදීමට සහ නෑමට පාවිච්චි කරන්නේ සුනාමියෙන් පසුව පිරිසිදු නොකල ලිං ජලය, සේදීම සඳහා පිරිසිදු ජලය ලබාගන්න අවශ්‍ය නම් කිලෝ මීටර් 2ක් පමන දුර යන්න ඕනෑ."

"මට ආදායමක් නැහැ. අප යැපෙන්නේ රාජ්‍ය නොවන සංවිධාන සහ පුන්‍යාධාර සංවිධාන මගින් දෙන සහනාධාරවලින්. මගේ වයස අවුරුදු හයක දරුවා ඉස්කෝලේ යනවා. අනෙක් දරුවට වයස අවුරුදු දෙකයි. ඔයාලා හිතලා බලන්න ස්ථිර ආදායමක් නැතිව මා කොහොමද ඔවුන්ව රැක බලා ගන්නේ.

"ලමුන් සහ කුඩා අතදරුවන් සහිත මා වගේ වැන්දඹුවන් පනහක් පමන මේ ප්‍රදේශයේ ඉන්නවා." ආන්ඩුවත්, අපේ නායකයෝවත් අප ඉන්න තත්වය ගැන සොයා බලන්නේ නැහැ. සහන ලබාදීම සහ අපේ තත්වය වැඩි දියුනු කිරීම ගැන පසුගිය අවුරුද්ද

ඇතුලත හුඟක් කථා අප ඇසුවා. නමුත් මේ දක්වා ඒ කිසිවක් කෙරිලා නැහැ.

සුනාමියට පෙර මරුදමුනෙයි ධීවර පවුල් 841 සිටියහ. ඔවුන් අතරින් 113ක් මරනයට පත්වූහ. ඔවුන් සියලු දෙනාටම ඔවුන්ගේ බෝට්ටු සහ මාලු දැල් අහිමි විය.

"අපට අපේ බෝට්ටු සහ දැල් අහිමි වුනා. බෝට්ටු 32ක් සහ ඒවාට අවශ්‍ය දැලුත් රාජ්‍ය නොවන සංවිධානවලින් ලබා දුන්න බව අපට අහන්න ලැබුනා. නමුත් අපට ඒවා ලබා ගන්න අවස්ථාවක් ලැබුනේ නැහැ. ඒවා ප්‍රදානය කලේ ධීවර දෙපාර්තමේන්තුවේ නිලධාරින් මගින්. ආධාර වශයෙන් දුන්න මෙම බෝට්ටුවලට අපට ගෙවන්න කිව්වා. රුපියල් 5,000 හෝ ඊට වැඩි මුදලක්. කිසිම ආදායමක් නැතුව අප ඒවගේ මුදලක් ගෙවන්නෙ කොහොමද? ඒ නිසා එම බෝට්ටු ව්‍යාපාරිකයන්ගේ අතට ගියා." අයි. එම්. තාලිගේ පැහැදිලි කලේ ය.

කලින් රෙදි විවීමෙහි යෙදී සිටි පවුල් 1,084 පවුල් 366 ඔවුන්ගේ අත්යන්ත්‍ර අහිමි විය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංඛ්‍යාලේඛනවලට අනුව ගමේ රෙදි විවීමේ කර්මාන්තයට සිදු වූ අලාභය රුපියල් මිලියන 6.8ක් පමන වෙයි. රෙදි විවීමෙන් ජීවත් වූවෝ දැන් බරපතල දුෂ්කරතාවලට මුහුන දී සිටිති.

අත් යන්ත්‍ර පේෂකාර්මිකයන්ට ඔවුන්ගේ කර්මාන්තය යලි ආරම්භ කිරීම සඳහා කිසිම සහයෝගයක් මෙතෙක් ලැබී නැති බව 48 වියැති එච්.එම්.එම්. නෂාර් පැවසී ය. "ඇත්තටම අප බලාපොරොත්තු සුන් වුන තත්වයක ඉන්නේ" ඔහු කීවේ ය.

ප්‍රදේශයේ පාසල් දෙකක් - ශාම්ස් මධ්‍යමහා විද්‍යාලය සහ පුල්වරාමන් විද්‍යාලය - මුලුමනින්ම විනාශයට පත් විය. තාවකාලික ස්ථානවල දැනට ඒවායේ පන්ති පවත්වනු ලබයි. ශාම්ස් මධ්‍යමහා විද්‍යාලයේ උප විදුහල්පති මෙසේ පැවසී ය.

"අපේ පාසලේ ශිෂ්‍යයන් 1450න් 108 දෙනෙකු මරනයට පත් වුනා. පාසල් ගොඩනැගිලි මුලුමනින්ම විනාශ වුනා. දැනට අප පන්ති පවත්වාගෙන යන්නේ පල්ලියකට අයිති බාගෙට හදාපු ගොඩනැගිල්ලක. පල්ලිය අවට පුද්ගලික ඉඩම්වල තැනූ කූඩාරම් ගනනාවකුත් අප ප්‍රයෝජනයට ගන්නවා."

"ශිෂ්‍යයන්ගෙන් හතරෙන් තුනක් පමන සුනාමි ව්‍යසනයට ගොදුරු වුනා. ඔවුන්ගේ නිවාස පමනක් නෙමෙයි අඩුම වසයෙන් ඔවුන්ගේ පවුල්වල එක් පුද්ගලයෙකු ඔවුන්ට අහිමි වුනා. විවිධ රාජ්‍ය නොවන සංවිධානවල උපකාර ඇතිව ඔවුන්ට දිගටම අධ්‍යාපනය කරගන යන්න හැකි වෙලා තියෙනවා."

"සුනාමියට පෙර ප්‍රමානවත් තරම් පහසුකම් සහ සම්පත් අපට තිබුනා. සුනාමියෙන් පසුව ප්‍රකාශයට පත් කල තහනම් ප්‍රදේශයේ පාසල තිබුන නිසා වෙනත් විකල්ප ස්ථානයක් සොයාගන්න කියලා අධ්‍යාපන අමාත්‍යංශය අපට කිව්වා දැනට ලන්ඩනයේ ජීවත්වන හිතවතෙක් අපට ඉඩමක් සල්ලිවලට අරගෙන දුන්නා.

නමුත් එම ඉඩම කුඹුරු ඉඩමක් නිසා පස් දාලා ගොඩ කරන්න ඕන. ඒ නිසා මූලික පහසුකම් සහිතව පාසලක් ගොඩනගන්න කාලයක් ගත වෙයි. දැනගන්න තියෙන් විදියට වර්ල්ඩ්විෂන් එක සමග ආන්ඩුව ගිවිසුමක් අත්සන් කර තියෙනවා. නමුත් ඉදිකිරීම් පටන්ගන්න දිනයක් මිනිස්සු දන්නෙ නැහැ.

"සුනාමියෙන් පසුව මුස්ලිම් නායකයන් ගනනාවක් ආවා. නමුත් එතරම් දෙයක් සිදු වුනේ නැහැ.විවිධ තැන්වල ඉගැන්වීම කරමින් ශිෂ්‍යයන් 1450ක් පාලනය කිරීම දුෂ්කරයි. ආන්ඩුව තහනම් සීමාව වරින්වර වෙනස් කරනවා. කලින් එය මීටර් 200යි. පසුව 100යි. දැන් මීටර් 65 කියලා තියෙනවා."

විරැකියාව ප්‍රදේශයේ බරපතල ප්‍රශ්නයකි. සිය පවුලේ සාමාජිකයන් අහිමිව, ඥාතීන් සමග ජීවත්වන මඩකලපුවේ අග්නිදිග විශ්වවිද්‍යාලයේ උගෙනුම ලබන 24 වියැති ශිෂ්‍යයෙකු තත්වය මෙලෙස විස්තර කලේ ය:

"අප කලේ වඩු වැඩ. සමහර වෙලාවට ප්‍රදේශයේ ධීවරයන් සමග මාලු ඇල්ලීමටත් සම්බන්ධ වුනා. දැන් අපට කිසිම රැකියාවක් නැහැ. මා හිතන්නේ මේ ප්‍රදේශයේ ලොකුම ප්‍රශ්නය විරැකියාව. හැම ආන්ඩුවක්ම ආරක්ෂා කරන්නේ සූරාකන්නන්ගේ උවමනාකම් මිස අපේ උවමනාවන් නෙමෙයි. අපේ කර්මාන්තය නැවත පටන් ගන්න පහසුකම් සපයන්න ඔවුන් උනන්දු නැහැ. නමුත් ඔබට පේනව නේද කොයි තරම් මුදලක් ඔවුන් යුද්ධයට නාස්ති කරනවද? අධ්‍යාපනයට සහ සෞඛ්‍ය සේවය සඳහා අරමුදල් ඔවුන් කපා දමනවා. තරුනයන්ට රැකියා සැපයීම සම්බන්ධව නිසි සැලැස්මක් නැහැ.

"පුද්ගලික දේපල ක්‍රමය තිබෙනතාක් දුරට මෙම ක්‍රමයන් පවතීවි. ඇෆ්ඝනිස්ථානයට සහ ඉරාකයට විරුද්ධ යුද්ධ ඒ රටවල සම්පත් අල්ලා ගැනීම සඳහා කෙරෙන යුද්ධ.

"මහජනතාවට යුද්ධ අවශ්‍ය නැහැ. එල්ටීටීඊය (දෙමල විමුක්ති කොටි සංවිධානය) සහ දේශපාලනඥයෝ සෑම වර්ගයක බේදයන් අවුස්සනවා. අපට උවමනා එකමුතු වෙන්න. නමුත් ඔවුන්ට අවශ්‍ය අපව බෙදීමට. අප සුනාමියට මුහුන දුන්න අවස්ථාවේ පලමුවෙන්ම අපේ පිහිටට ආවේ ලංකාව පුරාම සාමාන්‍ය ජනතාව. සිංහල ද දෙමල ද මුස්ලිම් ද කියලා නොතකා ඔවුන් අපට උපකාර කලා." ඔහු සාමාන්‍ය ජනතාව කල ඒ උදව් යලි මතකයට නැගී ය.

සියලුම වර්ගවල වාර්ගික දේශපාලනයට ඔහු විරුද්ධත්වය ප්‍රකාශ කලේ ය. සුනාමියෙන් සති කිහිපයකට පසුව, සිංහල ස්වෝත්තමවාදී සංවිධානයක් වන ජේවීපී සාමාජිකයන් ප්‍රදේශයට පැමින සමහර

වැඩ කල අතර බොහෝ දේවල් කිරීමට පොරොන්දු විය. නමුත් ඔවුහු යලි නොපැමිනියහ.

ඔහු එල්ටීටීඊයේ වර්ගවාදයට ඇඟිල්ල දිගු කලේ ය. මුස්ලිම් පුද්ගලයෙකු සුනාමියට ගොදුරු වූ ජනයා යලි පදිංචි කිරීම සඳහා පන්ඩිරිප්පු හින්දු විද්‍යාලය පිටුපසින් ඉඩමක් මිල දී ගත්තේ ය. නමුත් එහි වැඩ පටන්ගත් විට එය "දෙමල ප්‍රදේශයේ" පිහිටි ඉඩමක් නිසා වහාම වැඩ නතර කරන ලෙස එල්ටීටීඊය දැනුම් දී ඇත.

"දෙමල මහජනතාවට තම ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සඳහා සටන් කිරීමට අයිතියක් තියෙනවා. නමුත් එල්ටීටීඊය ඔවුන්ගේ ප්‍රදේශවල සිටින දෙමල ජනතාව මර්දනය කරනවා. අපේ ජනතාව ආරක්ෂා කිරීම සඳහා මුස්ලිම් නායකයන්ට පැහැදිලි ප්‍රතිපත්තියක් නැහැ. ඔවුන් ප්‍රදේශයට වෙනම (මුස්ලිම්) පාලන ප්‍රදේශයක් ඉල්ලනවා. එයින් සිදුවෙන්නේ ජනතාව අතර ආතතිය වැඩි වීම පමනයි."ඔහු පැවසී ය.

සුනාමියට ගොදුරුවූවන්ගේ සමාජ අවශ්‍යතා සැපිරීමට නොහැකි නිසා පාලක ප්‍රභූව - සිංහල දෙමල සහ මුස්ලිම් - මහජනතාව අතර වැඩෙන ආතතිය වාර්ගික ගැටුම් තුලට අපසරනය කිරීමට උත්සාහ දරා ඇත. දිනෙන් දින ඉහල යන ප්‍රචන්ඩ ක්‍රියා සහ මිනීමැරීම් යුද්ධය කරා යලි රට තල්ලු වෙතැයි උතුරු නැගෙනහිර සෙසු ප්‍රදේශවල මෙන් ම මරුදමුනෙයි ගමේ ජනයා ද වඩවඩා ඒත්තු ගනිමින් සිටිති.

© www.wsws.org